ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1123/2 – 2000 මාර්තු 13 වැනි සඳුදා – 2000.03.13
1123/2 ஆம் இலக்கம் – 2000 ஆம் ஆண்டு மாச்சு மாதம் 13 ஆம் திகதி திங்கட்கிழமை
No. 1123/2 – MONDAY, MARCH 13, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී 4/96 II.

### 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2000 මාර්තු මස 10 වන දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2000 පොකිරිස්සන් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බලපත්‍රලාභියෙකුට නිකුත් කර ඇති බලපත්‍රයේ "දකුණු වෙරළේ කටු පොකිරිස්සන් ඇල්ලීම සඳහා වලංගුය" යනුවෙන් පිටසන් කරනු ලැබ ඇත්නම් මිස, මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති මුහුදු ප්‍රදේශය ඇතුළත කටු පොකිරිස්සන් ඇල්ලීමේ ධීවර මෙහෙයුමක කිසිදු බලපත්‍රලාභියෙකු නිරත නොවිය යුතු ය.

3. (1) බලපත්‍රයේ හෝ වෙනත් යම් නියෝගයක හෝ මෙයට පටහැනි කවරක් සඳහන් වුවද මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මුහුදු ප්‍රදේශය ඇතුළත සැප්තැම්බර් සහ පෙබරවාරි යන මාස ඇතුළත කටු පොකිරිස්සන් ඇල්ලීමේ ධීවර මෙහෙයුමක කිසිදු බලපත්‍රලාභියෙකු නිරත නොවිය යුතු ය.

(2) මෙහි (1) ඡේදයේ සඳහන් කාර්යය සඳහා, කටු පොකිරිස්සන් හෝ කටු පොකිරිස්සන්ගේ කොටස් හෝ කටු පොකිරිස්සන් ඇල්ලීම සඳහා වූ උපකරණ හෝ ධීවර යාත්‍රාවක තබා ගැනීම, එවැනි තැනැත්තකු කටු පොකිරිස්සන් ඇල්ලීමේ කාර්යය සඳහා ධීවර මෙහෙයුමෙහි යෙදී සිටි බවට බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂි වන්නේ ය.

1 A – H 006837 – 1,400 (2000/03)

4. කිසිම තැනැත්තකු විසින් –

(1) උඩු කබලේ දිග සෙ. මී. දහයට අඩු හෝ මැන බැලීම සඳහා උඩු කබල නොමැති විට වලිගයේ දිග සෙ.මී. දහහතරට අඩු, පැනුලිරස් ඔ(ර්)නාටුස් විශේෂයට ගැනෙන කටු පොකිරිස්සන් ;

(2) මෙහි (1) ඡේදයේ දක්වා ඇති කටු පොකිරිස්සන් විශේෂය නොවන කටු පොකිරිස්සන් සම්බන්ධයෙන් වන විට, උඩු කබලේ දිග සෙ.මී. හයකට අඩු හෝ (මැන බැලීම සඳහා උඩු කබල නොමැති විට) වලිගයේ දිග සෙ.මී. දහයකට අඩු කටු පොකිරිස්සන් ;

(3) මෙහි (1) හෝ (2) ඡේදවල කාර්යයන් සඳහා මැන බැලීම කළ නොහැකි කටු පොකිරිස්සන් විශේෂ ; හෝ

(4) මෘදු කටුව සහිත කටු පොකිරිස්සන් ;

මිලට ගැනීම, විකිණීම, ප්‍රවාහනය කිරීම හෝ තම සන්තකයේ තබාගැනීම නොකළ යුතු ය.

5. (1) කිසිම තැනැත්තකු විසින් –

(අ) බාහිර බිත්තර සහිත කටු පොකිරිස්සන් හෝ බාහිර බිත්තර සහිත ස්ලිපර් පොකිරිස්සන් මිළට ගැනීම, විකිණීම, ප්‍රවාහනය කිරීම හෝ තම සන්තකයේ තබා ගැනීම ; හෝ

(ආ) බාහිර බිත්තර සහිත කටු පොකිරිස්සන්ගෙන් හෝ ස්ලිපර් පොකිරිස්සන්ගෙන් බිත්තර හෝ බිත්තර සම්බන්ධ වී පවතින ජලව පාද ඉවත් කිරීම;

නොකළ යුතු ය.

(2) බාහිර බිත්තර ඉවත් කරන ලද හෝ බිත්තර සම්බන්ධ වී පවතින ජලව පාද ඉවත් කරන ලද හෝ කටු පොකිරිස්සන්, ස්ලිපර් පොකිරිස්සන් හෝ ඔවුනගේ කොටස් සන්තකයේ තබා ගැනීම, එම තැනැත්තා විසින් බිත්තර ඉවත් කර ඇතැයි යන්න ඒත්තු ගැනීමට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි වන්නේ ය.

6. අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය පිට මිස, අවසරපත්‍රලාභියකු නොවන වෙනත් කිසිම තැනැත්තෙකු විසින් යම් කටු පොකිරිස්සෙකුගේ හෝ ස්ලිපර් පොකිරිස්සකුගේ මස්, තම සන්තකයේ තබා ගැනීම හෝ වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම හෝ ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු ය.

7. (1) 6 වන නියෝගය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මෙහි II වන උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමඟ රුපියල් තුන්සියයක ගාස්තුවක් ද ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම මෙහි III වන උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව විය යුතු අතර, එය කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස නිකුත් කරන දින සිට අවුරුදු එකක කාලයක් සඳහා වලංගු වන්නේ ය. තවද, ඒ අවසර පත්‍රය, එහි සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

8. (1) කිසිම තැනැත්තෙකු විසින් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය පිට මිස –

(අ) කිසිම කටු පොකිරිස්සෙකු හෝ කටු පොකිරිස්සන්ගේ මස් හෝ කටු පොකිරිස්සන්ගේ වලිග; හෝ

(ආ) ස්ලිපර් පොකිරිස්සකු හෝ ස්ලිපර් පොකිරිස්සන්ගේ මස් හෝ ස්ලිපර් පොකිරිස්සන්ගේ වලිග අපනයනය කිරීම නොකළ යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින් පෙබරවාරි සහ සැප්තැම්බර් මස තුළ කටු පොකිරිස්සන් හෝ ස්ලිපර් පොකිරිස්සන් හෝ යම් කටු පොකිරිස්සකුගේ හෝ ස්ලිපර් පොකිරිස්සෙකුගේ හෝ මස් හෝ වලිග අපනයනය කිරීම නොකළ යුතු ය.

9. (1) 8 වන නියෝගය යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි IV වන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමඟ රුපියල් එක් දහසක ගාස්තුවක් ද ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මෙහි V වන උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව විය යුතු අතර එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කරන ලද දින සිට හය මාසයක කාලයක් සඳහා, වලංගු වන්නේ ය. තවද, ඒ බලපත්‍රය සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

10. 1973 කටු පොකිරිස්සන් සහ ඉස්සන් නියෝග මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

මේ නියෝගවල –

"උඩු කබල" යන්නෙන්, ශීර්ෂෞරසයේ පිට ආවරණය හෝ හිස සහ උරස සම්බන්ධ වන කොටස හෝ (රූප සටහන 1 බලන්න) අදහස් වේ.

"උඩු කබලේ දිග" යන්නෙන්, උඩු කබලේ පූර්ව දාරයේ මධ්‍ය ලක්ෂයේ සිට තුණ්ඩ අං යුගලයේ පාදය අතරෙන් මධ්‍ය, ඉමේ සිට උඩු කබලේ අපර දාරය දක්වා පෘෂඨීය පැත්තෙන් මනිනු ලැබූ උඩු කබලේ දිග (රූප සටහන 1 බලන්න) අදහස් වේ.

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, කටු පොකිරිස්සන් හෝ ස්ලිපර් පොකිරිස්සන් හෝ ඇල්ලීම සඳහා වූ 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් සන්තකයේ තබා ගන්නා පුද්ගලයා අදහස් වේ.

"ස්ලිපර් පොකිරිස්සා" යන්නෙන්, සිලාරිඩේ පවුලට අයත් සියළුම විශේෂ (රූප සටහන 2 බලන්න) අදහස් වේ.

"මෘදු කටුව" යන්නෙන්, පිට සැකිල්ල හැලීමෙන් පසු දැඩි වීමට පෙර පොකිරිස්සාගේ අළුත් කටුව අදහස් වේ.

"කටු පොකිරිස්සා" යන්නෙන්, පහත සඳහන් පොකිරිස්සන් විශේෂ අදහස් වේ (රූප සටහන 1 බලන්න) :

පැනූලිරස් හෝමාරස්, පැනූලිරස් ලොන්ජිපෙස්, පැනූලිරස් ව(ර්)සිකොලර්, පැනූලිරස් ඔ(ර්)නාටුස්, පැනූලිරස් පෙනිසිලාටස්, පැනූලිරස් පොලිපේගුස්.

"වලිගයේ දිග" යන්නෙන්, පළමු උදර ඛණ්ඩයේ පූර්ව දාරයේ සිට පෞච්ඡ අන්ත්‍යයේ අපර දාරය දක්වා වලිගය ගෙන උදරීය මුහුණත පහළ දෙසට සිටින සේ කෙළින් හා සමතලාව තද කොට වලිගයේ පෘෂ්ඨීය පැත්තේ මධ්‍යම ඉම ඔස්සේ පෘෂ්ඨීය පැත්තේ ගනු ලබන මිම්ම (රූප සටහන 1 බලන්න) අදහස් වේ.

"අන්ත්‍යය" යන්නෙන්, වලිගයේ අවසාන උදර සන්ධිය අදහස් වේ. (රූප සටහන 1 බලන්න).

*සැ.යු .– රූප සටහන් ගැසට් පත්‍රයේ අවසානයේ පලකර ඇත.*

*(2 වන නියෝගය)*

## I වන උපලේඛනය

බෙන්තර ගඟේ මෝය සිට කුඹුක්කන් ගඟේ මෝය දක්වා දකුණු වෙරළ තීරයට අයත් මුහුදු ප්‍රදේශය

*(7 (1) වන නියෝගය)*

## II වන උපලේඛනය

**කටු පොකිරිස්සන්ගේ හෝ ස්ලිපර් පොකිරිස්සන්ගේ මස් සන්තකයේ තබාගැනීම හෝ වෙළඳම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීම පිණිස වූ ඉල්ලුම්පත්‍රය**

(මෙම ඉල්ලුම් පත්‍රය සමග රුපියල් තුන්සියයක ගාස්තුවක් ඉදිරිපත් කළ යුතුය)

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :———— .

2. (අ.) ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :———— .
   (ආ.) ඉල්ලුම්කරුට ලිපි එවිය යුතු ලිපිනය :———— .

3. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :———— .

4. ධීවර මෙහෙයුම සඳහා භාවිත කිරීමට අදහස් කරන යාත්‍රාවේ විස්තර :-
   (අ.) බෝට්ටුවේ වර්ගය :———— .
   (ආ.) බෝට්ටුවේ දිග :———— .
   (ඇ.) ලියාපදිංචි අංකය :———— .

මාගේ උපරිම දැනීමට අනුව ඉහත සඳහන් ප්‍රකාශයේ අඩංගු කරුණු සත්‍ය බව සහතික කරමි. අවසර පත්‍රයක් ලබාදෙන්නේ නම් නියෝගවලට සහ අවසර පත්‍රයේ කොන්දේසිවලට බැඳී සිටින බවට පොරොන්දු වෙමි.

————————,

ඉල්ලුම්කරුගේ අත්සන

[illegible] :———— .

*(7 (2) වන නියෝගය)*

## III වන උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

අවසර පත්‍ර අංකය :----------------.

කටු පොකිරිස්සන්ගේ හෝ ස්ලිපර් පොකිරිස්සන්ගේ මස් තම සන්තකයේ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍රය

..............................................................හි පදිංචි ..............................................................
.............................................................. යන අයට කටු පොකිරිස්සන්ගේ හෝ ස්ලිපර් පොකිරිස්සන්ගේ මස් තම සන්තකයේ තබාගැනීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ විකිණීමට හෝ ප්‍රවාහනය කිරීමට මෙයින් අවසර දෙමි.

1. මේ අවසර පත්‍රය කලින් අවලංගු කොට නොමැති නම්, .............................................................. දින දක්වා වලංගු වේ.

2. මේ අවසර පත්‍රය පහත සඳහන් නියමයන්ට හා කොන්දේසිවලට යටත් වේ :–

   (i) මේ අවසර පත්‍රය මෙහි නම් සඳහන් අයිතිකරුට පෞද්ගලික වන අතර එය අන් අයකුට පැවරිය නොහැකිය.

   (ii) මේ අවසර පත්‍රය ඉහත සඳහන් නියෝගවල විධිවිධානවලට යටත් වන්නේය.

____________________ ,
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ

දිනය :__________.

*(9 (1) වන නියෝගය)*

## IV වන උපලේඛනය

කටු පොකිරිස්සන් හෝ ස්ලිපර් පොකිරිස්සන් අපනයනය සඳහා ඉල්ලුම් පත්‍රය

(මෙම ඉල්ලුම් පත්‍රය සමග රුපියල් එක් දහසක ගාස්තුවක් ඉදිරිපත් කළ යුතු ය.)

1. ඉල්ලුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම ______________
2. ලිපිනය :________________
3. දුර ඇමතුම් අංකය :______________
4. ෆැක්ස් අංකය : ________________
5. පොකිරිස්සන් විශේෂවල නම් සහ ප්‍රමාණය :–

| *පොකිරිස්සන් විශේෂය* | *ප්‍රමාණය සහ බර* | *අල්ලාගත් ප්‍රදේශය* |
|---|---|---|
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |
| .............................. | .............................. | .............................. |

6. ඉල්ලුම්කරු විසින් පොකිරිස්සන් විශේෂය අපනයනය කිරීමට අදහස් කරනුයේ කුමන රටක් වෙතද : ———— .

මෙහි පහත අත්සන් කරන මම/අපි මෙහි සඳහන් කර ඇති සියලු විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි/කරමු. මෙහි සඳහන් කිරීමට නියමිත වූ විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම්, එවැනි විස්තර සැපයීම මත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම/අපි එකඟවෙමි/වෙමු.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ———— .

*(9 (2) වන නියෝගය)*

## V වන උපලේඛනය

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

### පොකිරිස්සන් අපනයනය කිරීම සඳහා බලපත්‍රය

............................................................හි පදිංචි........................................................................ ............................................................ යන අයට පහත දැක්වෙන පොකිරිස්සන් විශේෂ අපනයනය කිරීමට මෙයින් අවසරය දෙමි.

| 1. පොකිරිස්සන් විශේෂය | ප්‍රමාණය සහ බර | අල්ලාගත් ප්‍රදේශය |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |
| ............................................ | ............................................ | ............................................ |

2. මේ බලපත්‍රය කලින් අවලංගු කොට නොමැති නම් ........................................ දින දක්වා වලංගු වේ.

3. මේ බලපත්‍රය පහත සඳහන් නියමයන්ට හා කොන්දේසිවලට යටත් වේ.

   (i) මේ බලපත්‍රය මෙහි නම් සඳහන් අයිතිකරුට පෞද්ගලික වන අතර එය අන් අයකුට පැවරිය නොහැකිය.

   (ii) ........................................................

   (iii) ........................................................

————————,
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ.

———————— .

[illegible]6837 (2000/03)